# ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකාව



## තොරතුරු පත්‍රිකාව

**වගුව 1. ශ්‍රී ලංකාවඃ සංවර්ධන දර්ශක**

| | |
|---|---|
| සහශ්‍රක සංවර්ධන ඉලක්ක නොවන | |
| ජන සංඛ්‍යාව දශ ලක්ෂ වලින් | 20.20 (2008) |
| වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන අනුපාතය(%) | 0.8 (2006–2008) |
| වැඩිහිටි සාක්ෂරතා අනුපාතය (%) | 91.5 (2007) |
| නාගරික ප්‍රදේශ වල ජන අනුපාතය | 15.1 (2007) |
| සහශ්‍රක සංවර්ධන ඉලක්ක | |
| දිනකට ඩොලර් 1.25 වඩා අඩුවෙන් ජීවත්වන ජන අනුපාතය | 14.0 (2002) |
| ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහත ජීවත්වන ජන අනුපාතය | 15.2 (2007) |
| ජීව උපත් 1000 කට වයස 5 ට අඩු මරණ සංඛ්‍යාව | 21 (2007) |
| වැඩි දියුණු කළ ජල මූලාශ්‍ර භාවිතා කරන ජන අනුපාතය | 82 (2006) |

MDG = Millennium Development Goal.

මූලාශ්‍රඃ ADB. 2009. *Basic Statistics 2009*. Manila.
UNESCO. 2009. Institute for Statistics Data Centre.
World Bank. 2009. World Development Indicators Online.

ශ්‍රී ලංකාවේ සමාජ දර්ශක දකුණු ආසියාවේ හොඳම ඒවා අතර වේ. මෙම රට විශ්ව සාක්ෂරතාවය අත් කර ගැනීමට ආසන්නව සිටින අතර වඩාත් වැදගත්ව පිරිමි ළමයින් හා ගැහැණු ළමයින් සමාන මට්ටමක සිටී. පසුගිය දශක දෙක තුළ ආර්ථිකය කාර්යක්ෂම කිරීම සඳහා වැදගත් පියවර ගෙන වෙළඳාමට විවෘත කර ඇත. දශකයකට වැඩි කාලයක් 20% ක මට්ටමේ නොවෙනස්ව පැවති දරිද්‍රතාවය 2007 වසරේදී 15.2% දක්වා පහත වැටිණ. දරිද්‍රතාවය අඩු කිරීමට මූලික බාධාවන්ව ඇත්තේ රට තුළ සිවිල් ගැටුමක් පැවතීම, කෘෂිකාර්මික ශ්‍රමයේ ඵලදායකත්වය පහත වැටීම හා කොළඹින් බැහැර යටිතල පහසුකම් දුර්වල තත්වයක් පැවතීමයි.

රජයේ දශ අවුරුදු සංවර්ධන සැලැස්ම අඩු සංවර්ධන තත්වයක් පවතින ප්‍රදේශ කෙරේ අවධානය යොමු කරන අතර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ මූලික භූමිකාව ලෙස දකින්නේ රජයයි. මූලික ප්‍රතිපත්ති ලේඛන වලින් යටිතල පහසුකම් සංවර්ධනය හා ග්‍රාමීය ප්‍රදේශ වල ජීවන මාර්ග නගා සිටුවීමට යෝජනා කරයි. පුද්ගලීකරණය බැහැර කරන අතර රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිශෝධනයද න්‍යාය පත්‍රයට ඇතුළත්ය.

## ආසියානු සංවර්ධන බැංකුව සමග ඇති සම්බන්ධතාවය

ශ්‍රී ලංකාව ආසියානු සංවර්ධන බැංකුවට බැඳීමෙන් පසු මේ වන විට රාජ්‍ය හා රාජ්‍ය නොවන ණය 143 කට ඩොලර් කෝටි 436 ක් හා තාක්ෂණික ආධාර (TA) වැඩ සටහන් 229 කට ඩොලර් දශ ලක්ෂ $96.4 ක් ලබා දී ඇත. 2008 දෙසැම්බර් වන විට ඩොලර් කෝටි 181 ක ණය ප්‍රමාණයක් වන රාජ්‍ය ණය 41 ක් පැවති අතර ඊට ආසියානු සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ඩොලර් දශ ලක්ෂ $60 ක වැඩ සටහනක් හා ආසියානු සුනාමි අරමුදලෙන් කරන ලද ඩොලර් දශ ලක්ෂ $150 ක ප්‍රදානයක්ද ඇතුළත් වේ. මෙම ණය 41 න් 10 ක් පොදු ප්‍රාග්ධන සම්පත් වලින් මූල්‍යනය කර ඇති අතර ඉතිරි 31 ලබා ගෙන ඇත්තේ ආසියානු සංවර්ධන අරමුදලෙනි. 2008 දෙසැම්බර් 31 වන විට ශුද්ධ ණය ප්‍රමාණයෙන් 51% ක්ම ලබා දී ඇත.

ශ්‍රී ලංකාවට ලබා දෙන ආධාර ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික ආධාර වල සිට බල ශක්ති, මහා මාර්ග තැනීම හා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම දක්වා ව්‍යාප්ත වී ඇත. අධ්‍යාපන අංශයේ මැදිහත්වීම් වන්නේ උසස් අධ්‍යාපනයට පිවිසීම පුළුල් කිරීම, කුසලතා සංවර්ධනය හා පාඨ මාලා නවීකරණය සඳහාය. දැනුවත් සමාජයක් සඳහා වන අධ්‍යාපන ව්‍යාපෘතිය (EKSP) ඩොලර් දශ ලක්ෂ $65 ක ණයක් හා ඩොලර් දශ ලක්ෂ $15 ක ප්‍රදානයකින් සමන්විත වන ඩොලර් දශ ලක්ෂ $80 ක ආසියානු සංවර්ධන මූල්‍යනයකින් 2008 දී ඇරඹිණ. EKSP ව්‍යාපෘතියෙන් ද්වීතියික පාසල් 120 ක් වැඩි දියුණු කරන අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය නගා සිටුවීමට දිගටම කටයුතු කරනු ඇත. ඊට අමතරව මෙම ව්‍යාපෘතිය එච්අයිවී/ ඒඩ්ස් සෞඛ්‍ය අධ්‍යාපනයට සහාය ලබා දීම දිගටම කරනු ඇත.

ප්‍රධාන වශයෙන් ජපානයෙන්ද ඊට අමතරව ජර්මනිය හා වෙනත් රටවල සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ ද සහයෝගිතාවය ඇතිව ආසියානු සංවර්ධන බැංකුව බල ශක්ති අංශයේද සැලකිය යුතු ප්‍රමාණයක ආයෝජනයක් කර ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ විශාලතම දායකත්වය වන්නේ මහා මාර්ග ඉදි කිරීමට වන අතර දක්ෂිණ ලංකා ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රථම සීමිත පිවිසුම් අධිවේගී මාර්ගය ඉදිවේ. කිලෝමීටර් 128 ක් දිගින් යුත් එය කොළඹ දකුණු පළාතේ මාතර සමග සම්බන්ධ කරනු ඇත.

2008 ඔක්තෝබර් මාසයේදී ආසියානු සංවර්ධන බැංකුව 2009–2011 සඳහා ශ්‍රී ලංකාවට රටට අදාල නව හවුල්කාරිත්ව උපාය මාර්ගය (CPS) අනුමත කළාය. නව CPS උපාය මාර්ගය රජයේ උපදේශන සහිතව සකස් කළ නිසා රජයේ දශ අවුරුදු සංවර්ධන සැලැස්ම වන මහින්ද චින්තනයටද සම්බන්ධ වේ.

## ආධාර වල බලපෑම

උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය (NECORD) සමග ඇරඹුණ ආසියානු සංවර්ධන බැංකුවේ පශ්චාත් ගැටුම් ආධාර ලබා දීම මේ දක්වා ඉතා සාර්ථකව සිදු වේ. අනෙකුත් සංවර්ධන හවුල්කරුවෝ මෙම ආදර්ශය අනුගමනය කළා හෝ සිය මූල්‍ය ආධාර NECORD ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ඒකකය හරහා යොමු කරන මෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් ඉල්ලා සිටියහ. එය ආර්ථික වර්ධනයට හා දරිද්‍රතාවය අඩු කිරීමට අවශ්‍ය වන්නේ කුමන ආකාරයේ කුඩා පරිමාණ යටිතල පහසුකම් ද යන්න ජන කොටසම තීරණය කළ පසු අනුකූලතාවය හා උපාය මාර්ගික වටිනාකම පිළිබඳව ප්‍රාදේශීය කමිටුවකින් නිරීක්ෂණය කෙරෙන පහළ සිට ඉහළට යන පිවිසුම යොදා ගනී. දැනටමත් ග්‍රාම සංවර්ධන සැලසුම් 58 කටත් වැඩි සංඛ්‍යාවක් හා සුළු මාර්ග, රෝහල්, පාසල්, ජල සැපයුම් හා සනීපාරක්ෂාව, වාරිමාර්ග හා නිවාස සඳහා වන සුළු පරිමාණයේ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් සිය ගණනක් අනුමත කර ඇත.

මෙය සාර්ථකව ක්‍රියාත්මක වීමට විශාල වශයෙන් දායක වී ඇත්තේ පවතින රාජ්‍ය ව්‍යුහයන් යොදා ගැනීමත්, උතුරු හා නැගෙනහිර අදාල සියලු පාර්ශ්වයන් සම්බන්ධ කර ගැනීමේ ඉතා ඉහළ මට්ටමක සහභාගිත්වයක් පවත්වා ගැනීමත්ය. කෙසේ වෙතත් ගැටුම්කාරී තත්වය උත්සන්න වීමත් සමග ජනතාව අවතැන්වීම, ඉදි කිරීමේ පිරිවැය විශාල වශයෙන් ඉහළ යෑම හා සුදුසු කොන්ත්‍රාත්කරුවන් සොයා ගැනීමේ දුෂ්කරතාවය වැනි කරුණු නිසා ප්‍රගතියේ වේගය අඩාල විය. ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකාවට ලබා දුන් ආධාර ප්‍රවාහන අංශයේ භෞතික, ආයතනික හා ප්‍රතිපත්ති සීමාවන් විසඳීමට යොමු කෙරිණ. පසුගිය දශක දෙකක කාලයේදී ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දුන් ආධාර, 2007 දී සිදු කළ රටට ලබා දුන් ආධාර වැඩ සටහන ඇගයීමේදී, සැලකිය යුතු, ඒවා ලෙස තක්සේරු කර ඇත. ව්‍යාපෘති හතරකින් ජාතික මහා මාර්ග කිලෝ මීටර් 1265 ක් ප්‍රතිස්ථාපනය කොට, උසස් කොට, වැඩි දියුණු කරන ලදී. කාර්යක්ෂම තාවය වැඩි කිරීම හා පිරිවැය අඩු කිරීම වශයෙන් අපේක්ෂිත බලපෑම සාක්ෂාත් කර ගන්නා ලදී. නිම කරන ලද මහා මාර්ග වල රථ වාහන ධාවනය ප්‍රමාණවත් මට්ටමක පැවති අතර එම වර්ධනය ආර්ථික වර්ධනය පිළිබිඹු කරයි. වාහන ධාවන වියදම් හා ගත වන කාලය අඩු වී ප්‍රවාහන සේවා වැඩි දියුණු විය.

බල ශක්ති අංශයට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දුන් ආධාර නිසා ශ්‍රී ලංකාවේ විදුලි බලය ලබා දීමේ අනුපාතය 2003 දී පැවති 67% සිට 2007 වන විට 79% දක්වා වැඩි විය. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බල ශක්ති අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නව ග්‍රාමීය නිවාස 150,000 කට විදුලිය සම්බන්ධතා ලබා දෙනු ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ රජයට නව උප පොළ ජාල පහක් ඉදි කිරීමටත්, දැනට පවතින උප පොළ ජාල 13 ක් වැඩි දියුණු කිරීමටත් නව සම්ප්‍රේෂණ මාර්ග කි.මී. 53.5 ක් ඉදි කිරීමටත් හැකි විය. දැනට ක්‍රියාත්මක වන හා අනාගත ආධාර විදුලි බලය ලබා දීමේ අනුපාතය වැඩි කිරීමට අමතරව නව ජාල උප පොළ හා සම්ප්‍රේෂණ මාර්ග ඉදි කිරීම හා වැඩි දියුණු කිරීම, 16.7% සිට 13.5% ක් වූ 2009 පවතින තාක්ෂණික පාඩුව 2016 දී 12% දක්වා අඩු කිරීමටත් සැලසුම් කර ඇත. මෙම අංශයේ කාර්යක්ෂම තාවය තවදුරටත් වැඩි කිරීමේ පියවර හඳුන්වා දීමට ආසියානු සංවර්ධන බැංකුව රජය සමග ක්‍රියා කරයි.

දශක ගණනාවක්ම ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්තියේ මූලස්ථම්භයක් වූයේ අධ්‍යාපනයේ ආයෝජනයයි. අධ්‍යාපන අංශයට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දෙන ආධාර වලින්, පරිගණක මධ්‍යස්ථාන, ගුරු පුහුණුව, පාඨ මාලා සංවර්ධනය හා පාසල් පදනම් වූ තක්සේරු කිරීම හා කළමනාකරණය හඳුන්වා දීමෙන් ද්විතීයික අධ්‍යාපනය නවීකරණයට සහාය වේ. දුරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුව දුරස්ථ අධ්‍යාපන ජාලයක් සංවර්ධනය කිරීමට සහාය වේ. මෙම

### වගුව 2. ශ්‍රී ලංකාව: ආර්ථික දර්ශක, 2004–2008

| ආර්ථික දර්ශක | 2004 | 2005 | 2006 | 2007 | 2008 |
|---|---|---|---|---|---|
| ඒක පුද්ගල GNI, ඇට්ලස් ක්‍රමය ($) | 1,070 | 1,200 | 1,350 | 1,540 | … |
| GDP වර්ධනය ( වසරකට වෙනස්වීම%) | 5.4 | 6.2 | 7.7 | 6.8 | 6.0 |
| CPI ( වසරකට වෙනස්වීම %) | 9.0 | 11.0 | 10.0 | 15.8 | 22.6 |
| විරැකියා අනුපාතය (%) | 8.3 | 7.7 | 6.5 | 6.0 | 5.2 |
| මූල්‍ය තුලනය (% of GDP) | -7.9 | -8.4 | -8.0 | -7.7 | -6.8 |
| අපනයන වර්ධනය (වසරක වෙනස්වීම % ක් වශයෙන්) | 12.2 | 10.2 | 8.5 | 11.0 | 6.5 |
| ආනයන වර්ධනය (වසරක වෙනස්වීම % ක් වශයෙන්) | 19.9 | 10.8 | 15.7 | 10.2 | 24.0 |
| වර්තන ගෙවුම් ශේෂය (ද.දේ.නි. % වශයෙන්) | -3.1 | -2.7 | -5.3 | -4.5 | -7.1 |
| විදේශීය ණය (% of GNI) | 54.2 | 46.7 | 41.7 | 43.9 | … |

… = දත්ත ලැබී නැත, CPI = පාරිභෝගික මිල දර්ශකය, GDP = දළ දේශීය නිෂ්පාදිතය, GNI = දළ ජාතික ආදායම.

මූලාශ: ADB. 2009. *Asian Development Outlook 2009*. Manila.
ADB staff estimates.
World Bank. 2009. World Development Indicators Online.

### වගුව 3. ශ්‍රී ලංකාව: 2008 ණය, තාක්ෂණික ආධාර, අනුමත කළ ප්‍රදාන (ඩොලර් දශ ලක්ෂ වලින්)

| ණය | | | | |
|---|---|---|---|---|
| රාජ්‍ය | රාජ්‍ය නොවන | තාක්ෂණික ආධාර | ප්‍රදාන | එකතුව |
| 149.8 | – | 1.9 | 27.2 | 178.9 |

- = නැත.

සමුච්චිත ණය දීම් (2008 දෙසැම්බර් 31 වන විට) : ඩොලර් දශ ලක්ෂ 4,355.5
සමුච්චිත මුදාහැරීම් (2008 දෙසැම්බර් 31 වන විට) : ඩොලර් දශ ලක්ෂ 3,161.7

### වගුව 4. ශ්‍රී ලංකාව: 2008 දෙසැම්බර් 31 වන විට සමුච්චිත ආසියානු සංවර්ධන බැංකු ණය දීම්

| අංශය | ණය (සංඛ්‍යාව) | ප්‍රමාණය (ඩොලර් දශ ලක්ෂ) | %[a] |
|---|---|---|---|
| කෘෂිකාර්මික හා ස්වභාවික සම්පත් | 38 | 797.65 | 18.31 |
| අධ්‍යාපනය | 11 | 351.90 | 8.08 |
| බල ශක්තිය | 11 | 397.75 | 9.13 |
| මුදල් | 20 | 483.50 | 11.10 |
| සෞඛ්‍යය, පෝෂණය හා සමාජ සංරක්ෂණය | 2 | 35.40 | 0.81 |
| කර්මාන්ත හා වෙළඳාම | 11 | 243.15 | 5.58 |
| නීතිය, ආර්ථික කළමනාකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති | 6 | 183.00 | 4.20 |
| බහු අංශීය | 17 | 439.30 | 10.09 |
| ප්‍රවාහන හා සන්නිවේදන | 19 | 1.048.80 | 24.08 |
| ජල සැපයුම, සනීපාරක්ෂාව, කසළ කළමනාකරණය | 8 | 375.07 | 8.61 |
| එකතුව | 143 | 4,355.53 | 100.00 |

[a] ආසන්න සංඛ්‍යාවට පත් කර ඇති නිසා එකතුව නොසැසඳේ.

### වගුව 5. ශ්‍රී ලංකාව: ව්‍යාපෘති සාර්ථකවීමේ අනුපාතය

| අංශ අනුව | ප්‍රතිශතය[a] | අනුපාතයට සකස් කළ ව්‍යාපෘති/වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|
| කෘෂිකාර්මික හා ස්වභාවික සම්පත් | 28.6 | 28 |
| අධ්‍යාපනය | 83.3 | 6 |
| බල ශක්තිය | 85.7 | 7 |
| මුදල් | 57.1 | 7 |
| සෞඛ්‍යය, පෝෂණය හා සමාජ සංරක්ෂණය | 100.0 | 2 |
| කර්මාන්ත හා වෙළඳාම | 80.0 | 5 |
| නීතිය, ආර්ථික කළමනාකරණය හා රාජ්‍ය ප්‍රතිපත්ති | 50.0 | 2 |
| බහු අංශීය | 33.3 | 6 |
| ප්‍රවාහන හා සන්නිවේදන | 80.0 | 5 |
| ජල සැපයුම, සනීපාරක්ෂාව, කසළ කළමනාකරණය | 100.0 | 2 |
| එකතුව | 54.3 | 70 |
| අනුමත කළ වසර අනුව | | |
| 1960s | 50.0 | 2 |
| 1970s | 41.7 | 12 |
| 1980s | 50.0 | 24 |
| 1990s | 62.1 | 29 |
| 2000s | 66.7 | 3 |

[a] ව්‍යාපෘති/ වැඩසටහන් නිම කිරීමේ වාර්තා (PCRs) PCR තහවුරු කිරීමේ වාර්තා (PCRVRs) ව්‍යාපෘති/වැඩසටහන් අගැයීමේ වාර්තා (PPER) හා PCR සහ PCRVR/PPER අනුපාත ලබා ගත හැකි විට PCRVR හෝ PPER යොදා ගනිමින් සම්භාර ප්‍රතිඵල මත පදනම්ව සකසා ඇත.

මූලාශ: PCRs, PCRVRs, and PPERs containing a rating circulated as of 31 December 2008.

ජාලයෙන් නැගෙනහිර දිස්ත්‍රික්ක දෙකක් ඇතුළුව අඩු සංවර්ධිත දිස්ත්‍රික්ක වල ශිෂ්‍යයන්ට තම දිස්ත්‍රික්කයේ පිහිටි මධ්‍යස්ථානයක සිට කොළඹ නාභියට (Hub) සම්බන්ධ වීමටත්, අධ්‍යයන තොරතුරු වලට පිවිසීම, ප්‍රශ්න පත්‍ර ලබා ගැනීම හා ප්‍රවේශ විභාග වලට පෙනී සිටීමට හැකි කරවයි. ද්විතීයික අධ්‍යාපන පද්ධතිය නවීකරණය හා තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය දිවයින පුරාම ව්‍යාප්ත කිරීමට ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දීමට හා ද්විතීයික පාසල් 1,200 ක් ඒ ශ්‍රේණියේ පාසල් බවට උසස් කිරීම හා ගුණාත්මක ද්විතීයික අධ්‍යාපනයට පිවිසීමේ සමානාත්මතාවය වැඩි කිරීම අරමුණු කර ගත් ද්විතීයික අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (SEMP II) 2005 දී ආරම්භ කෙරිණ. ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර වනුයේ කලාපීය/ පළාත් අධ්‍යාපන කාර්යාල ශක්තිමත් කිරීම, අඩු වරප්‍රසාද සහිත ශිෂ්‍යයින් 50,000 ක් දක්වා ප්‍රමාණයකට ලබා දෙන ආධාර ප්‍රමාණය පවත්වා ගෙන යෑම, ජාතික අධ්‍යාපන පද්ධතිය නවීකරණය කිරීම, ද්විතීයික අධ්‍යාපන පාඨ මාලාව නවීකරණය හා අධ්‍යාපන අමාත්‍යාංශයේ හැකියාවන් ගොඩ නැගීම යි.

සියලු දෙනාට පානීය ජල සැපයුම හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීමේ ඉලක්ක වලින් එකක් වන අතර ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර වැඩ සටහනෙන් දශ ලක්ෂ දෙකකට පානීය ජලය සැපයීමට උදව් කර ඇත. එය ආයතනික හැකියාවන් ගොඩ නගා අංශීය ප්‍රතිශෝධන වලට සහාය වූයේය. 2008 වසරේදී ආසියානු සංවර්ධන බැංකුව දිවයිනේ වඩාත් වියලි ප්‍රදේශයේ පිහිටි මන්නාරම, හලාවත, පුත්තලම හා වවුනියාව යන ප්‍රධාන නගර වල 300,000 ක ජනතාවක් ආවරණය වන නව ණය මුදලක් අනුමත කෙළේය.

## අනාගත දිශානති

රජයේ දස අවුරුදු සංවර්ධන සැලැස්ම වන මහින්ද චින්තනයේ කේන්ද්‍රීය වන්නේ මහා පරිමාණයේ යටිතල පහසුකම් හා බුද්ධි ආර්ථිකයේ ආයෝජනයෙන් හා ග්‍රාමීය සංවර්ධනයට අවධානය යොමු කිරීමෙන් ඉහළ වර්ධන අනුපාතයක් අත් කර ගැනීමය. ඉදිරි වසර 3 තුළ ශ්‍රී ලංකාවේ ආසියානු සංවර්ධන බැංකුවේ කටයුතු CPS 2009-2011 අනුව සිදු කෙරෙනු ඇත. නව CPS මහා මාර්ග, ජල සැපයුම හා බල ශක්තිය ඇතුළත් වසරකට ඩොලර් දශ ලක්ෂ 210 ක් ගලා එන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවධානය යොමු කෙරේ. මුදල් කළමනාකරණය සඳහා සැලසුම් කළ වැඩසටහනක්ද, අධ්‍යාපනය පිළිබඳ පොරොත්තු ව්‍යාපෘතියක්ද ඇති අතර මෙම ක්ෂේත්‍ර දෙකටම කලින් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ලැබී ඇත.

**වගුව 6. ශ්‍රී ලංකාවː 2007-2008 රාජ්‍ය ණය සඳහා කාණ්ඩ ක්‍රියාකාරිත්ව ගුණාත්මක දර්ශක**

| | | |
|---|---|---|
| දැනට පවතින ණය සංඛ්‍යාව (2008 දෙසැම්බර් 31 වන විට) | | 41 |
| | 2007 (ඩොලර් දශ ලක්ෂ) | 2008 (ඩොලර් දශ ලක්ෂ) |
| ගිවිසුම් පිරිනැමු/නියම වූ | 116.0 | 611.0 |
| ගෙවීම් | 137.8 | 249.5 |
| ණය අවදානම (%) | 15.2 | 4.9 |

**වගුව 7. ශ්‍රී ලංකාවː 2004 ජනවාර් 1 සිට 2008 දෙසැම්බර් 31 දක්වා ආ.ස.බැංකු ණය ව්‍යාපෘති වලට සම්බන්ධ ගිවිසුම්/සැපයුම්කරුවන්**

| ගිවිසුම්/සැපයුම්කරු | අංශය | ගිවිසුම්ගත මුදල (ඩොලර් දශ ලක්ෂ) |
|---|---|---|
| සීමාසහිත කීග්නෑම් එන්ටර්ප්‍රයිසස්. | ප්‍රවාහන හා සන්නිවේදන | 90.40 |
| China Geo-Salcon-Access JV | ජල සැපයුම, සනීපාරක්ෂාව හා කසළ කලමනාකරණය | 52.22 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ජල සැපයුම, සනීපාරක්ෂාව හා කසළ කලමනාකරණය | 22.72 |
| සීමාසහිත සියරා කන්ස්ට්‍රක්ෂන් සමාගම. | බහු අංශීය | 21.69 |
| ICC China Harbour Joint Venture | ප්‍රවාහන හා සන්නිවේදන | 19.73 |
| ඉන්ටර් නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝර්ටියම් | බහු අංශීය | 19.58 |
| සීමාසහිත කන්සල්ටින් ඉන්ජියරින් ඇන්ඩ් කන්ට්‍රැක්ටර්ස් (පුද්) . | බහු අංශීය | 19.23 |
| කේ.ඩී.ඒ. වීරසිංහ සහ සමාගම | ප්‍රවාහන හා සන්නිවේදන | 14.68 |
| සීමාසහිත ඊ.ඩබ්ලිව්..ඉන්ෆොමේෂන් සිස්ටම්ස් | බහු අංශීය | 13.12 |
| සීමාසහිත හොවීල් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම. | ප්‍රවාහන හා සන්නිවේදන | 11.11 |

යටිතල පහසුකම් හා සම්බන්ධතාවය නොමැති වීම සාර්ව ආර්ථික ස්ථායීතාවය හා සාමය නොමැති වීම පුද්ගලික අංශයේ වර්ධනයට ඇති ප්‍රධාන බාධා දෙක ලෙස ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව හඳුනාගෙන ඇත.

ගැටුම නිසා වැඩ කිරීමට බාධා පැමිණ ඇති නමුත් හැකි අවස්ථාවල දිගටම එම වැඩ කෙරී ගෙන යයි. රටේ නැගෙනහිර ව්‍යාපෘති නැවතත් පටන් ගෙන ඇති (මඩකලපුවේ ජල සැපයුම වැනි) අතර ඉන් රටේ වඩාත්ම නොසලකා හැර ඇති ප්‍රදේශයක බෙහෙවින්ම අවශ්‍ය කෙරෙන යටිතල පහසුකම් සැපයේ.

## මෙහෙයුම් අභියෝග

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ජයග්‍රහණ සැලකිය යුතු මට්ටමක පවතී. කලාපයේ වෙනත් රටවලට වෙනස්ව පුද්ගලික අංශයේ වර්ධනයට දූෂණය බලවත් බාධකයක් නොවන බව පෙනේ.

නැගෙනහිර වැඩ වේගවත් වෙමින් ප්‍රධාන හමුදා මෙහෙයවීම් අවසන් වීමත් සමග උතුරේ වැඩ නැවත පටන් ගැනීමට හැකියාවක් පැවතියදී ව්‍යාපෘති වලින් ප්‍රජාවන් අතර නුරුස්නා ගතිය තීව්‍ර නොවීම අතිශයෙන් වැදගත් වන අතර ඒවා සමනය කිරීමට සියලු ප්‍රයත්නයන් දැරිය යුතුය. සිවිල් සමාජය හා වෘත්තීය සමිති බෙහෙවින් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරන නිසා ව්‍යපෘති වලට උනන්දුවක් දක්වන අය පුළුල් ලෙස විමසිය යුතු අතර හැකි තාක් දුරට එකඟතාවයකට පැමිණිය යුතුය. ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට නිතරම හේතුවක් වන දීර්ඝ වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැන් සහසම්බන්ධීකරණ හා නවීකරණ පිවිසුම් වලින් විසඳා ඇත.

## හවුල්කාරී බව

ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල්කරුවන් අතර සහයෝගිතාවය ඉතා හොඳ මට්ටමක පවතින අතර සුනාමිය සම්බන්ධ යළි ඉදි කිරීම් වලින් එය වඩාත් තහවුරු විය. ප්‍රතිපත්ති ගැලපීම් සහතික කිරීමටත් ද්වි ගුණනය මග හැරීමටත් ප්‍රතිපත්ති හා උපාය මාර්ගික කරුණු වලදී ආසියානු සංවර්ධන බැංකුව අනෙකුත් ප්‍රදානක ආයතන සමග සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනී. 2007 දී ආසියානු සංවර්ධන බැංකුව නව CPS සඳහා පාරිසරික තක්සේරුව සකස් කරන ලද්දේ ලෝක බැංකුව සමග එක්වීය.

**වගුව 8. ශ්‍රී ලංකාවː 2004 ජනවාරි 1 සිට 2008 දෙසැම්බර් 31 දක්වා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ව්‍යාපෘති වලට සම්බන්ධ ඉහළම උපදේශකයින් (පුද්ගල උපදේශක හා උපදේශන සමාගම්)**

| උපදේශක | ගිවිසුම් වලට එළඹි වාර ගණන | ගිවිසුම් ගත මුදල (ඩොලර් දශ ලක්ෂ වලින්) |
|---|---|---|
| සීමාසහිත ප්‍රයිස්වෝටර්හවුස් කූපර්ස් | 4 | 3.85 |
| සීමාසහිත රිසෝර්ස් ඩිවලොප්මන්ට් කන්සල්ටන්ට් | 5 | 1.61 |
| ශ්‍රී ලංකාවේ පුද්ගල උපදේශකයන්* | 34 | 1.20 |
| සීමාසහිත ග්‍රීන් ටෙක් කන්සල්ටන්ට් (පුද්) | 3 | 0.60 |
| ශ්‍රී ලංකාවේ මහ බැංකුව | 2 | 0.50 |
| කාර්මික සේවා කාර්යංශය | 1 | 0.26 |
| ITDG | 1 | 0.26 |
| ආකිටෙක්චරල් ඉන්ජියරිං කන්සල්ටන්සි | 1 | 0.20 |
| ඇග්‍රොමාටි ෆවුන්ඩේෂන් | 1 | 0.20 |
| සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවාව | 2 | 0.14 |

* ආවරණය වූ කාලය තුළ උපදේශකයන්ට ගිවිසුම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් තිබිය හැක.

**වගුව 9. ශ්‍රී ලංකාවː 2004 ජනවාරි සිට 2008 දෙසැම්බර් 31 දක්වා ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික ආධාර ව්‍යාපෘතී වලට සම්බන්ධ ඉහළම උපදේශකයින් (පෞද්ගලික උපදේශකයන් හා උපදේශක සමාගම්)**

| උපදේශක | ගිවිසුම් අත්සන් කළ වාර ගණන | ගිවිසුම් මුදල (ඩොලර් දශ ලක්ෂ) |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ පුද්ගල උපදේශකයින්* | 70 | 1.79 |
| ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් ලංකා (පුද්.) | 3 | 1.38 |
| සීමාසහිත ඉන්ෆොටෙක්-අයිඩියාස් (පුද්) | 1 | 0.42 |
| දරිද්‍රතාවය විග්‍රහ කිරීම සඳහා වූ මධ්‍යස්ථානය (CEPA) | 2 | 0.35 |
| සීමාසහිත එනර්ජි ෆෝරම් (Guarantee) | 1 | 0.33 |
| මානසික සෞඛ්‍යය සඳහා සහනය ජාතික මණ්ඩලය | 1 | 0.06 |

* ආවරණය කළ කාල පරිච්ඡේදයේදී උපදේශකයින්ට එක ගිවිසුමකට වඩා තිබිය හැක.

ආසියානු සංවර්ධන බැංකුව තම සේවාවන්හි කාර්යක්ෂමතාවය, ගුණාත්මක භාවය හා කල්පවත්නා බව ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ සංවිධාන සමග පුළුල්තම සහයෝගතාවයක් පවත්වා ගනී. නිදසුනක් වශයෙන් ප්‍රජා මූලික සංවිධාන හා පළාත් පාලන ආයතන සමග එකතුව රාජ්‍ය නොවන සංවිධාන උතුරු මැද පළාතේ ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා ජල සැපයුම් හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය ජල සැපයුම් වැඩ සටහන ක්‍රියාත්මක කරනු ඇත.

ඉතාම හොඳ භාවිතාවන් හැඳින ගැනීමට හා සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආසියානු සංවර්ධන බැංකුව 2007 දී අදාල සියලු පාර්ශ්වයන් සමග සාකච්ඡා කිරීමෙන් උපදේශන හා සහභාගිත්ව සැලැස්මක් සකස් කරන ලදී. මූලික උපාය මාර්ගික පාර්ශ්වකරුවන් හැඳින ගැනීම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා ආරම්භක පාර්ශ්වකරුවන් විග්‍රහ කිරීමේ වැඩමුළුවක් ශ්‍රී ලංකාවේ නේවාසික කණ්ඩායම 2008 දී පවත්වන ලදී.

## හවුල් මූල්‍යනය හා ප්‍රසම්පාදනය

හවුල් මූල්‍යනය කටයුතු තුළින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යමය හවුල් කරුවන්ට - එනම් රජය හෝ එහි නියෝජිත ආයතන වලට, බහුපාර්ශ්වීය මූල්‍ය ආයතන හා වානිජ සංවිධාන වලට - බැංකුවේ ව්‍යාපෘති වලට මුදල් ලබා දීමට සහභාගි විය හැක. අතිරේක අරමුදල් ප්‍රදාන, නිල ණය හෝ ණය ලබා ගැනීමේ හැකියාව වැඩි කෙරෙන නිමැවුම් වලින් සැපයේ.

2008 වසර අවසාන වන විට ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතීන් 26 ක් සඳහා වටිනාකම් එකතු කළ හවුල් මූල්‍යන සංචිතය ඩොලර් දශ ලක්ෂ $857.3 ක් වූ අතර තාක්ෂණික ආධාර ව්‍යාපෘති 25 ක් සඳහා ඩොලර් දශ ලක්ෂ $9.9 ක් විය.

2008 දී නෙදර්ලන්තය ජල මූල්‍යන හවුල්කාරී පහසුකම යටතේ වියලි කලාපීය ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියට හවුල් මූල්‍යනය සඳහා ඩොලර් දශ ලක්ෂ $2.0 ක ප්‍රදානයක් කෙළේය.

2004 ජනවාරි 1 සිට 2008 දෙසැම්බර් 31 දක්වා හවුල් මූල්‍යනය ඇති ව්‍යාපාතිවල සාරාංශයක් www.adb.org/Document/fact Sheets/ Sri Lanka/cofiíncing.asp හි ඇත.

2008 දෙසැම්බර් 31 වන විට ඩොලර් කෝටි $4.17 ක ආසියානු සංවර්ධන බැංකුවේ ණය ව්‍යාපෘති යටතේ උපදේශන ගිවිසුම් 10330 ක් ලබා දුන් අතර ඉන් ඩොලර් දශ ලක්ෂ $34.9 ක උපදේශන 463 ක් ශ්‍රී ලංකාවේ උපදේශකයන්ට ලබා දෙන ලදී.

1985 ජනවාර් 1 සිට 2008 දෙසැම්බැර් 31 දක්වා ඩොලර් කෝටි $2.33 ක ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික ආධාර ව්‍යාපෘති 18,104 ක උපදේශන ගිවිසුම් ලබා දුන් අතර ඉන් ඩොලර් දශ ලක්ෂ $15.0 ක උපද්ශන 262 ක් ශ්‍රී ලංකාවේ උපදේශකයින්ට ලබා දෙන ලදී.

භාණ්ඩ හා වැඩ හා උපදේශන සේවා සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් හා උපදේශකයන්ට ලබා දුන් ප්‍රසම්පාදන ගිවිසුම් වල සාරාංශයක් www.adb.org/documents/factSheets/Sri lanka/procurement.asp. හි ඇත.

## ශ්‍රී ලංකාව හා ආසියානු සංවර්ධන බැංකුව ගැන

ශ්‍රී ලංකාව කලාපයේ කොටස්කරුවන් අතුරින් 16 වන විශාල රට වන අතර සමස්ත කොටස් කරුවන්ගෙන් 24 වැනියා වේ.

ආසියානු සංවර්ධන බැංකුවේ සාමාජිකත්වය

| | |
|---|---|
| ඇතුළු වූයේ: | 1966 |
| සතුව ඇති කොටස්: | 20,520 (0.58) |
| ඡන්ද: | 33,752 (0.76) |

ක්යුන්ග්-හෝ කිම් විධායක අධ්‍යක්ෂ වන අතර ජේම්ස් ට්සුවෙන්-හුවා ෂිහ් විකල්ප අධ්‍යක්ෂ ලෙස ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ශ්‍රී ලංකාව නියෝජනය කරයි.

රිචඩ් ඩබ්ලිව්. ඒ. වොක්ස් ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකාවේ සිටින නේවාසික අධ්‍යක්ෂ වරයාය. ශ්‍රී ලංකාවේ නේවාසික දූත මණ්ඩලය (SLRM) 1998 දී විවෘත කළ අතර එය මූලික වශයෙන් සියලු කටයුතු වලදී බැංකුව හා රජය, පුද්ගලික අංශය හා සිවිල් සමාජයේ අදාල පුද්ගලයන් අතර මෙහෙයුම් සම්බන්ධතාවය පවත්වා ගනී.

බැංකුවේ කටයුතු හා සම්බන්ධ රාජ්‍ය ආයතනය වන්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයයි.

## ආසියානු සංවර්ධන බැංකුව ගැන

මෙම බැංකුව කලාපයේ රටවල් 48 ක් හා ලොව සෙසු ප්‍රදේශ වල රටවල් 19 කින් සැදුම් ලත් සාමාජිකයන් 67 කට අයත් බහුපාර්ශ්වීය සංවර්ධන බැංකුවකි. එය සිය සංවර්ධනය වන සාමාජික රට වලට සහාය ලබා දෙන ප්‍රධාන උපකරණ වන්නේ ප්‍රතිපත්ති සංවාදය, ණය, කොටස් ආයෝජනය, ඇප සහතික, ප්‍රදාන හා තාක්ෂණික ආධාරයි. 2008 දී බැංකුවේ ණය පරිමාව, තාක්ෂණික ආධාර ඩොලර් දශ ලක්ෂ $274.5 (ව්‍යාපෘති 299) හා ප්‍රදාන මූල්‍ය ව්‍යාපෘති (49) සඳහා ඩොලර් දශ ලක්ෂ $811.4 ක් වශයෙන් ඩොලර් කෝටි $10.49 කි. මීන් හවුල්කාරිත්ව මෙහෙයුම් වලට මුදල් යෙදවීමෙන් ඍජු වටිනාකම් එකතු වූ හවුල් මූල්‍යන වශයෙන් ඩොලර් කෝටි $1.65 ක්ද ජනනය කෙරිණ. පසුගිය වසර පහ තුළ (2004–2008) බැංකුවේ වාර්ෂික ණය පරිමාවේ සාමාන්‍යය, තාක්ෂණික ආධාර වශයෙන් ඩොලර් දශ ලක්ෂ $231.5 ක් හා ප්‍රදාන මූල්‍යන ව්‍යාපෘති සඳහා ඩොලර් දශ ලක්ෂ $655.1 ක්ද වශයෙන් ඩොලර් කෝටි $7.70 ක් විය. 2008 දෙසැම්බර් 31 වන විට සමුච්චිත එකතුන් වූයේ රටවල් 41 ක ව්‍යාපෘති 2,147 ක් සඳහා ඩොලර් කෝටි $143.53 ක ණය මුදලක් හා ප්‍රදාන ව්‍යාපෘති 263 ක් සඳහා ඩොලර් කෝටි $4.08 ක් හා තාක්ෂණික ආධාර ව්‍යාපෘති 6,599 ක් සඳහා ඩොලර් කෝටි $3.55 කි.

## සම්බන්ධතා

### ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩලය
49/14-15 ගාලු පාර,
කොළඹ 03. ශ්‍රී ලංකාව.
දුරකතන: +94 11 238 7055
ෆැක්ස්: +94 11 238 6527
adbslrm@adb.org
www.adb.org/SLRM

### ආසියානු සංවර්ධන බැංකුව මූලස්ථානය
6 ඒඩීබී ඇවිනියු, මන්ඩලුයොන්ග්,
1550 මෙට්‍රෝ මැනිලා, පිලිපීනය.
දුරකතන: +63 2 632 4444
ෆැක්ස්: +63 2 636 2444
information@adb.org

### මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
තැ. පෙ. 277, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකතන: +94 11 248 4500/248 4600/248 4700
ෆැක්ස්: +94 11 244 9823/242 2507/244 7633
www.treasury.gov.lk

### ප්‍රයෝජනවත් වෙබ් අඩවි
ආසියානු සංවර්ධන බැංකුව
**www.adb.org**

මෙරට වෙබ් අඩවිය:
**www.adb.org/srilanka**

Asian Development Outlook
**www.adb.org/Documents/Books/ADO/2009/SRI.pdf**

වාර්ෂික වාර්තාව:
**www.adb.org/Documents/reports/annual_report/2008/**

තැන්පතු පුස්තකාල:
**www.adb.org/Publications/Depositories/sri.asp**

මෙම ප්‍රකාශනයේ $ අදහස් වන්නේ ඇමරිකානු ඩොලරයයි.
දිනය වෙනත් ආකාරයට සඳහන් කර නැතිනම් 2008 දෙසැම්බර් 31 වනදාය. තොරතුරු පත්‍රිකා වාර්ෂිකව යාවත් කාලීන කරන්නේ මාර්තු මාසයේදීය.